සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2022
ආදර්ශ ප්‍රශ්න පත්‍රය
General certificate of Education (Adv. Level) Examination 2022
Model Paper

ආර්ථික විද්‍යාව I
Economics I

21 S I

පැය දෙකයි
Two Hours

උපදෙස්

- ***සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න***
- *උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න*
- *උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න*
- ***1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන පරිදි කතිරයක් (×) යොදා දක්වන්න***

01. ආර්ථික විචල්‍යයන් අතර සම්බන්ධතාව දැක්වෙන ප්‍රකාශ කිහිපයක් පහතින් දැක්වේ. ඒවා අතරින් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශය කුමක්ද?

1. විදේශ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වන විට, අපනයන ආදායම ඉහළ යයි.
2. භාණ්ඩයකින් නිපදවන ප්‍රමාණය වැඩි වන විට ආයතනයේ මුළු පිරිවැය ඉහළ යයි.
3. පොලී අනුපාතිකය සහ ආයෝජනය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇත.
4. පොදු මිල මට්ටම ඉහළ යන විට සේවා වියුක්තිය පහළ වැටේ.
5. අයවැය හිඟය පුළුල් වන විට, මුදල් සැපයුම වැඩි විය හැකිය.

02. 2021 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය කොපමණද? යන පැනයට පිළිතුර ලෙස ශිෂ්‍යයෙක් 3.66% යැයි පවසන ලදි. මෙම සිසුවා ගේ පිළිතුර ආර්ථික විද්‍යාත්මකව හඳුනා ගත යුත්තේ,

1. සත්‍ය ප්‍රකාශයක් ලෙස වේ.
2. අභිමතානුරූපී ප්‍රකාශයක් ලෙස වේ.
3. ආර්ථික න්‍යායක් ලෙස වේ.
4. අසත්‍ය ප්‍රකාශයක් ලෙස වේ.
5. යථානුරූපී ප්‍රකාශයක් ලෙස වේ

03. නිෂ්පාදන හැකියා වක්‍රයක් ගොඩනැංවීමට අවශ්‍ය උපකල්පනයක් නොවන්නේ,

1. සම්පත් බෙදීයාම කාර්යක්ෂමව සිදු වන බව උපකල්පනය කිරීම.
2. එම රට භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවන බව උපකල්පනය කිරීම.
3. තාක්ෂණය නොවෙනස්ව පවතින බව උපකල්පනය කිරීම.
4. එම රට සතු සම්පත් සම්භාරය වැඩි හෝ අඩු නොවන බව උපකල්පනය කිරීම.
5. පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය අත්කරගන්නා බව උපකල්පනය කිරීම.

04. එක්තරා ආර්ථික පද්ධතියක නිෂ්පාදන හැකියා වක්‍රය පහතින් දැක්වේ.



මෙම නිෂ්පාදන හැකියා වක්‍රය සම්බන්ධයෙන් පහත දී ඇති ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශය තෝරන්න.

1. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයට භාවිතා කරන ශිල්ප ක්‍රම පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය සඳහා නොගැලපෙන බව
2. භාණ්ඩ දෙකේම ආවස්ථික පිරිවැය වැඩි වෙන බව
3. පරිභෝජන භාණ්ඩ නිශ්පාදනය වැඩි කරන විට ප්‍රාග්ධන භාණ්ඩ කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවන බව.
4. සෑම ශ්‍රමිකයෙකුගේ ම ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමට දක්වන කුසලතාව හා පරිභෝජන භාණ්ඩ නිපදවීමට දරන කුසලතාව සමාන බව.
5. ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමට භාවිතා කරන ඇතැම් යන්ත්‍ර සූත්‍ර පරිභෝජන භාණ්ඩ නිපදවීමට යොදා ගත නොහැකි බව.

05. කාලයත් සමග නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය P_1P_1 සිට P_2P_2 දක්වා දකුණට විතැන් වී ඇති ආකාරය පහත දැක්වේ.



කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය A සිට B ප්‍රමාණයකින් වැඩි කිරීමේ ආවස්ථික පිරිවැය වනුයේ,

1. P_1 සිට P_2 වේ.
2. 0EBC වේ.
3. 0 සිට C වේ.
4. ABCD වේ.
5. ශුන්‍ය වේ.

06. ආර්ථික විද්‍යාව හදාරන සිසුවෙක් විසින් නම්‍යතාව සම්බන්ධව ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් කිහිපයක් පහතින් දැක්වේ.

a) තොග පවත්වාගෙන යාමේ හැකියාව ඉහළ නම් එම භාණ්ඩය සඳහා ඇති සැපයුම නම්‍ය වේ.
b) සලකා බලන භාණ්ඩයට ඇති ආදේශන ප්‍රමාණය වැඩිනම් ඇත්තේ අනම්‍ය ඉල්ලුමකි.
c) සාධක සංචලන හැකියාව දුෂ්කර වන විට එම භාණ්ඩය සඳහා ඇත්තේ අනම්‍ය සැපයුමකි.
d) භාණ්ඩයකින් ලබා ගත හැකි ප්‍රයෝජන ප්‍රමාණය වැඩිනම් එම භාණ්ඩය සඳහා ඇත්තේ අනම්‍ය ඉල්ලුමකි.

ඉහත සඳහන් ප්‍රකාශ වලට අනුව,

1. a පමණක් සත්‍ය වේ.
2. b පමණක් සත්‍ය වේ.
3. a, c සහ d පමණක් සත්‍ය වේ.
4. c, b සහ d පමණක් සත්‍ය වේ.
5. සියලුම ප්‍රකාශ සත්‍ය වේ.

07. එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සම්බන්ධයෙන් ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත වේ. එම භාණ්ඩයට අදාළව පහත කවරක් නිවැරදි වේද?

P = 50 – ½ Qd
P = 10 + ½ Qs

	සමතුලිත මිල	සමතුලිත ප්‍රමාණය	පාරිභෝගික අතිරික්තය	නිෂ්පාදන අතිරික්තය	සමතුලිත මිලෙහි මිල ඉල්ලුම් නම්‍යතාවය
1.	30	30	400	400	-0.5
2.	30	40	450	450	-1.5
3.	40	30	400	450	-0.5
4.	30	40	400	400	-1.5
5.	40	40	450	450	-0.5

08. 2021 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා රජය රසායනික පොහොර ආනයනය සඳහා පැනවූ තහනම හේතුවෙන් සහල් සැපයුම පහළ බසින ලදී. එම තත්වය හමුවේ සහල් වෙළෙඳපොළ සමතුලිතයට කවර බලපෑමක් ඇති කරයිද?

	සමතුලිත මිල	සමතුලිත ප්‍රමාණය
1.	අඩු වේ.	අඩු වේ.
2.	වැඩි වේ.	වැඩි වේ.
3.	වැඩි වේ.	අඩු වේ.
4.	අඩු වේ.	වැඩි වේ.
5.	නොවෙනස්ව පවතී.	අඩු වේ.

09. කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සම්බන්ධයෙන් සැපයුමේ මිල නම්‍යතාව එකට අඩු අගයක් ගනු ලබන අතර, රජය විසින් එම භාණ්ඩය සඳහා සහනාධාරයක් ලබා දීමට කටයුතු කරයි. මේ අනුව, පහත කවර ප්‍රකාශයක් මෙම පාරිභෝගික භාණ්ඩය සම්බන්ධයෙන් නිවැරදි වේද?

1. සමතුලිත මිල ඉහළ නගින අතර සහනාධාරයෙන් වැඩි කොටසක් පාරිභෝගිකයාට හිමිවේ.
2. සමතුලිත මිල පහළ බසින අතර සහනාධාරයෙන් වැඩි කොටසක් නිෂ්පාදකයාට හිමිවේ.
3. සමතුලිත මිල ඉහළ නගින අතර සහනාධාරය පාරිභෝගිකයාට පමණක් හිමිවේ.
4. සමතුලිත මිල පහළ බසින අතර සහනාධාරය නිෂ්පාදකයාට පමණක් හිමිවේ.
5. සමතුලිත මිල ඉහළ නගින අතර සමතුලිත ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.

10. තේ මිල 10% ඉහළ යන විට කෝපි ඉල්ලුම් ප්‍රමාණය 20% දක්වා වැඩි විය. මේ අනුව නිවැරදිව ගණනය කරන ලද ඉල්ලුම් නම්‍යතාව වනුයේ,

1. -1.5
2. 1.5
3. 2
4. -2
5. 0.5

Sabaragamuwa University Of Sri Lanka

11. භාණ්ඩයේ මිලෙහි වෙනසක් නොමැතිව සමතුලිත ප්‍රමාණය ඉහළ යා හැක්කේ,

1. ඉල්ලුම අනම්‍ය වී සාධක මිල ගණන් ඉහළ යාම.
2. ඉල්ලුම පූර්ණ නම්‍ය වී සාධක මිල ගණන් අඩු වීම.
3. ඉල්ලුම පූර්ණ අනම්‍ය වී තාක්ෂණය දියුණු වීම.
4. සැපයුම පූර්ණ නම්‍ය වී පාරිභෝගික රුචිය අඩු වීම.
5. ඉල්ලුම පූර්ණ අනම්‍ය වී සාධක මිල ගණන් ඉහළ යාම.

12. රජය විසින් මිල පාලන ප්‍රතිපත්ති අනුගමනය කිරීම හරහා වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයට බලපෑම් සිදුකරයි. එවැනි මිල පාලන ප්‍රතිපත්තියක් වන උපරිම මිල සීමා නියම කිරීම නිසා ඇති වන ප්‍රතිවිපාක සම්බන්ධව පහත ප්‍රකාශ අතුරින් කවර ප්‍රකාශයක් අසත්‍ය වේද?

1. නීති විරෝධී කළු කඩ මිලක් යටතේ භාණ්ඩ අලෙවි කිරීමට තැත් කිරීම.
2. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට බලපෑම් වී සමාජ සුභසාධනය පහත වැටීම.
3. අතිරික්ත නිෂ්පාදනය වෙළෙඳපොළෙහි ගොඩගැසීම.
4. නිෂ්පාදකයින් ලාභ ලැබීම සීමා වන නිසා එම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන අඩු වීම.
5. අධි ඉල්ලුම නිසා වෙළඳපොළෙහි භාණ්ඩ හිඟයක් ඇති වීම.

13. එක්තරා කෘෂිකාර්මික භාණ්ඩයක් සම්බන්ධයෙන් ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$$Qs = -20 + 2P$$
$$P = 50 - 0.5Qd$$

රජය විසින් මෙම කෘෂිකාර්මික භාණ්ඩයට රු. 40 ක සහතික මිලක් පනවා නිෂ්පාදකයා ආරක්ෂා කරමින් නිෂ්පාදකයාගේ ආදායම ඉහළ නැංවීම උදෙසා අතිරික්තය මිලට ගැනීමට කටයුතු කරයි නම්, රජය දරන පිරිවැය කොපමණද?

1. 1200
2. 800
3. 2400
4. 1600
5. 1100

14. භාණ්ඩයක නිෂ්පාදනය කිරීමේ මුළු පිරිවැය පහත ලේඛනයේ දැක්වේ.

නිමැවුම	මුළු පිරිවැය
0	1500
1	1700
2	1850
3	1950

මෙම භාණ්ඩයේ ඒකක තුනක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) කොපමණද?

1. AVC 150, MC 100
2. AVC 150, MC 450
3. AVC 650, MC 100
4. AVC 650, MC 450
5. AVC 500, MC 200

15. ආයතනයක් කෙටි කාලයේ දී වසා දැමීමට තීරණය කරනු ලබන්නේ,

1. ආයතනය ලබන ලාභය, මුළු විචල්‍ය පිරිවැයට වඩා අඩු වන බැවිනි.
2. ආයතනය ලබන ලාභය, මුළු ස්ථාවර පිරිවැය ට වඩා අඩු වන බැවිනි.
3. ආයතනයේ සාමාන්‍ය අයභාරය, ආයතනයේ සාමාන්‍ය පිරිවැයට වඩා අඩු වන බැවිනි.
4. ආයතනය නිෂ්ප්‍රාමාණික ලාභ නොලබන බැවිනි.
5. ආයතනයේ සාමාන්‍ය අයභාරය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය ට වඩා අඩු වන බැවිනි

Sabaragamuwa University Of Sri Lanka

16. ආයතනයක නිෂ්පාදනය පිළිබඳ පහත විස්තර ඔබට සපයා තිබේ.

නිමැවුම (ටොන්)	මුළු පිරිවැය (රුපියල් '000')
0	20
1	30
2	35
3	40
4	45
5	50

මෙම තොරතුරු අනුව ටොන් 5ක් නිපදවන විට මෙම ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය(AVC) කොපමණද?

1. රුපියල් 4.00 කි.
2. රුපියල් 5.00 කි.
3. රුපියල් 6.00 කි.
4. රුපියල් 10.00 කි.
5. රුපියල් 12.00

17. සත්‍යය සුනිශ්චිත පරිභෝජනයට අදාල වන දෑ වන්නේ,

a) කුටුම්භ අවසන් පරිභෝජනය
b) ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක වලට සේවා සපයන ආයතන විසින් භාණ්ඩ හා සේවා වලට දරන වියදම
c) රජයේ පෞද්ගලික පරිභෝජන වියදම
d) සාමූහික පරිභෝජන වියදම

1. a සහ b
2. a සහ c
3. a, b සහ c
4. a, b, c, සහ d
5. ඉහත කිසිවක් නොවේ

18. ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළෙඳ ගිණුමේ හා සේවා ගිණුමේ හිඟයක් පවතින විට එම තත්වය දේශීය නිමැවුම හා දේශීය ඉතුරුම් සම්බන්ධයෙන් කවර බලපෑමක් ඇති කරයිද?

	දේශීය වියදමට සාපේක්ෂව නිමැවුම	දළ ආයෝජනයට සාපේක්ෂව ඉතුරුම්
1.	පහළ යයි.	ඉහළ යයි.
2.	පහළ යයි.	පහළ යයි.
3.	ඉහළ යයි.	ඉහළ යයි.
4.	ඉහළ යයි.	පහළ යයි.
5.	පහළ යයි.	වෙනස් නොවේ.

19. පහත දී ඇති තොරතුරු වලට අනුව,

පෞද්ගලික පරිභෝජනය	3000
දළ ස්ථාවර ප්‍රාග්ධනය	800
ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම	100
ආදායම රාජ්‍ය මිලදී ගැනීම්	900
තොග වෙනස්වීම්	-50
අපනයන	600
ආනයන	1000

දළ දේශීය නිෂ්පාදිතය වන්නේ,

1. 4650
2. 4250
3. 4300
4. 4100
5. 4150

Sabaragamuwa University Of Sri Lanka

20. පහත දී ඇති තොරතුරු වලට අනුව,

විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම	10
වර්තන ගිණුමේ ශේෂය	-25
අපනයන	5
විදේශ වලින් ලැබෙන සාධක ආදායම්	7
විදේශ වලට ගෙවූ සාධක ආදායම්	12

ආනයන වන්නේ,

1. 35
2. 30
3. 25
4. -30
5. 40

21. පහත දී ඇති තොරතුරු වලට අනුව,

කුටුම්භ අවසන් පරිභෝජනය	50000
රාජ්‍ය අවසන් පරිභෝජනය	20000
ලාභ අපේක්ෂාවෙන් තොර අවසන් පරිභෝජනය	8000
ලාභ අපේක්ෂාවෙන් තොර අවසන් සාමූහික පරිභෝජනය	1000

පෞද්ගලික පරිභෝජන වියදම වන්නේ,

1. 49000
2. 42000
3. 58000
4. 55000
5. 46000

22. පහත ප්‍රකාශ අතුරින් නිරවද්‍ය වනුයේ,

a) යම් කාලච්ඡේදයක් තුළ සමස්ත ආදායම සමස්ත වියදමට සමාන වීම, සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන කාන්දුවීම් හා විදීම් ප්‍රවේශයයි.

b) සමාහාර ඉල්ලුම, පෞද්ගලික පරිභෝජනය, රාජ්‍ය පරිභෝජනය, ආයෝජනය හා ශුද්ධ අපනයන වලින් සමන්විතයි.

c) සාර්ව ආර්ථික සමතුලිතය ප්‍රවේශ තුනක් යටතේ ඉදිරිපත් කළ හැකිය.

1. c පමණි.
2. a සහ c පමණි.
3. b පමණි.
4. a, b සහ c
5. b සහ c පමණි.

23. පහත ප්‍රස්ථාරයෙහි රේඛීය පරිභෝජන ශ්‍රිතයක් දැක්වේ. මෙම පරිභෝජන ශ්‍රිතයෙහි ස්වායත්ත පරිභෝජන වියදම රුපියල් 4000 ක් වේ නම්, B ලක්ෂයෙදී මුළු පරිභෝජන වියදම (x) කොපමණද?



1. රුපියල් 18,000 කි.
2. රුපියල් 17,000 කි.
3. රුපියල් 16,000 කි.
4. රුපියල් 14,000 කි.
5. රුපියල් 10,000 කි.

Sabaragamuwa University Of Sri Lanka

24. එක්තරා ආර්ථිකයක ස්වායක්ත වියදම රුපියල් මිලියන 100 කින් ඉහළ යන විට, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 500 කින් ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැම්යාව විය යුත්තේ,

1. 0.2 කි.
2. 0.4 කි.
3. 0.5 කි.
4. 0.8 කි.
5. 5.0 කි.

25. සාර්ව ආර්ථික කළමනාකරණයේ දී රජය විසින් භාවිත කර ගනු ලබන ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තියක් වනුයේ,

1. රාජ්‍ය මූල්‍ය (පිස්කල්) ප්‍රතිපත්තිය
2. සෘජු පාලන ප්‍රතිපත්තිය
3. සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය
4. ආදායම් ප්‍රතිපත්තිය
5. විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

26. උද්ධමනයකදී මුදලේ කාර්යයන් අතරින් බෙහෙවින් බලපෑමට ලක්වන කාර්යයන් මොනවාද?

1. විනිමය මාධ්‍යක් ලෙස කටයුතු කිරීම හා ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම.
2. වටිනාකමේ සන්නිධියක් හා කල්පසු වූ ණය ගෙවීම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
3. කුඩා කොටස්වලට බෙදීමේ හැකියාව හා ප්‍රවාහනය පහසු වීම.
4. අනුකරණ මුදල් නිකුත් කිරීම අපහසු වීම හා ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම.
5. පොදු පිළිගැනීම.

27. කිසියම් ආර්ථිකයක මුදල් සැපයුම රුපියල් බිලියන 5000ක් ද, මුදල් සංසරණ ප්‍රවේගය 10ක් ද, මූර්ත ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 400 ක් ද වේ යැයි උපකල්පනය කළහොත් මෙම ආර්ථිකයේ මිල මට්ටම කවර අගයක් ගනු ලබයි ද?

1. 40 කි.
2. 50 කි.
3. 125 කි.
4. 400 කි.
5. 500 කි.

28. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් වූ කල්පිත වාණිජ බැංකු පද්ධතියකට අදාල ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැන්පතු	100000	සංචිත	10000
ප්‍රාග්ධනය	10000	සුරකුම්පත්	5000
		ණය	95000
	110000		110000

මහජනතාව සතු ව්‍යවහාර මුදල් තොගය රුපියල් මිලියන 8000කි. ණය මැවීමේ ක්‍රියාවලිය අවසානයේ ආර්ථිකයේ නව මුදල් සැපයුම කොපමණද ?

1. රුපියල් මිලියන 95,000කි.
2. රුපියල් මිලියන 118,000කි.
3. රුපියල් මිලියන 108,000කි.
4. රුපියල් මිලියන 100,000කි.
5. රුපියල් මිලියන 103,000කි.

Sabaragamuwa University Of Sri Lanka

29. බැංකු පද්ධතිය 0.25 ක සංචිත අනුපාතයක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව මහජනතාව රුපියල් 100ක් තැන්පත් කිරීම හේතුවෙන් මුදල් සැපයුම උපරිම ප්‍රසාරණය වනුයේ,

1. 400 කි.
2. 300 කි.
3. 4000 කි.
4. 25 කි.
5. 75 කි.

30. පහත සඳහන් සාධක අතරින් පිරිවැයෙන් තල්ලු වන උද්ධමනයට හා ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය ට බලපාන සාධක පිළිවෙලින්,

1. අයවැය හිඟය ඉහළ යාමක්, ශුද්ධ අපනයන ඉහළ යාමක්
2. යෙදවුම් මිල ඉහළ යාමක්, පොලී අනුපාතික පහළ වැටීමක්
3. මුදල් සැපයුම ප්‍රසාරණය වීමක්, ආනයන මිල ඉහළ යාමක්
4. වැටුප් මිල ඉහළ යාමක්, විනිමය අනුපාතික ක්ෂය වීමක්
5. වැයකළ හැකි ආදායම ඉහළ යාමක්, ශ්‍රම ඵලදායිතාවය පහළ වැටීමක්.

31. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් වූ කල්පිත වාණිජ බැංකු පද්ධතියකට අදාල ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැන්පතු	50000	සංචිත	10000
		සුරැකුම්පත්	2000
		ණය	38000
	50000		50000

මහජනතාව සතු ව්‍යවහාර මුදල් තොගය රුපියල් මිලියන 10000 කි. මහජනතාව බැංකු පද්ධතියෙන් රුපියල් මිලියන 3000ක් ඉවත් කර ගත්තේ නම් ලබාදිය හැකි ණය ප්‍රමාණය කොපමණද?

1. රුපියල් මිලියන 38,000කි.
2. රුපියල් මිලියන 36,000කි.
3. රුපියල් මිලියන 26,000කි.
4. රුපියල් මිලියන 50,000කි.
5. රුපියල් මිලියන 28,000කි.

32. අර්ධ පොදු භාණ්ඩ වල පවතින ප්‍රධාන ගුණාංග පමණක් අයත් වන වරණය තෝරන්න.

1. මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම, පරිභෝජනය තරඟකාරී නොවීම.
2. මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම, පරිභෝජනය තරඟකාරී වීම.
3. මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ හැකි වීම, ධාරිතා මට්ටම ලඟා වනතෙක් පරිභෝජනය තරඟකාරී වීම.
4. මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ හැකි වීම, ධාරිතා මට්ටම ලඟා වනතෙක් පරිභෝජනය තරඟකාරී නොවීම.
5. මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම, ධාරිතා මට්ටම ලඟා වනතෙක් පරිභෝජනය තරඟකාරී නොවීම.

33. වෙළෙඳපොළ අසමත් වීමට උදාහරණයක් නොවන්නේ,

1. දිළිඳු දරුවෙකුට ජීවත්වීමට අවශ්‍ය කිරි ප්‍රමාණය පොහොසත් පවුලක සුනඛයෙකු විසින් පරිභෝජනය කිරීම.
2. පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් යන දෙපාර්ශ්වයටම අවශ්‍ය වන තොරතුරු ප්‍රමාණවත් පරිදි ලැබීම.
3. පොදු සම්පත් වල අයිතිය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමට නොහැකිවීම.
4. වෙළඳපොලේ භාණ්ඩ හා සේවා වල මිල ගණන් විශාල ලෙස ඉහල යාමෙන් ඇතිවන උද්ධමනකාරී වාතාවරණය.
5. සුඛසාධන භාණ්ඩ ඌණ නිෂ්පාදනයක් සිදු වීම හා අවගුණ භාණ්ඩ අධි නිෂ්පාදනයක් සිදු වීම.

Sabaragamuwa University Of Sri Lanka

34. සුබසාධන භාණ්ඩයක් සඳහා වන පරිභෝජනයේ ධන බාහිරතා ගැලපුම් කළ පසු ප්‍රශස්ත නිමැවුම් මට්ටම පහත දැක්වේ.



මෙසේ නිදහස් වෙළඳපොල තුළ ඇති වෙළෙඳපොළ අකාර්යක්ෂමතා අවම කරමින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට නම්,

1. දැනට සපයන භාණ්ඩ ප්‍රමාණය ම ඉහළ මිලකට ලබා දීම.
2. අඩු මිලක් යටතේ භාණ්ඩ ඒකක වැඩි ප්‍රමාණයක් සැපයිය යුතුය.
3. ඉල්ලුම් වක්‍රය වමට විතැන් කළ යුතුය.
4. භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් නම්‍යතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
5. භාණ්ඩයේ නිෂ්පාදන මත ඒකක බද්දක් පැනවිය යුතුය.

35. අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රසාරණාත්මක මූලාශ්‍රය හෙවත් උද්ධමනකාරී ප්‍රභවය කුමක්ද?

1. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
2. මහජන බැංකුව
3. සේවක අර්ථසාධක අරමුදල
4. සණස සංවර්ධන බැංකුව
5. නිදන් මුදල්

36. වෙළෙඳ අනුපාතය අයහපත් වන විට,

1. අපනයන ඒකකයකින් මිලට ගත හැකි ආනයන ඒකක ප්‍රමාණය පහත වැටෙයි.
2. දෙන ලද ආනයන ප්‍රමාණයක් මිලට ගැනීම සඳහා අපනයනය කළ යුතු ඒකක ප්‍රමාණය අඩුවෙයි.
3. විදේශ විනිමය අනුපාතිකය පිරිහෙයි.
4. දේශීය අපනයන සඳහා විදේශ ඉල්ලුම පහත වැටෙයි.
5. වෙළෙඳ ගිණුමේ හිඟයක් ඇති වෙයි.

37. කළඹ ආයෝජන හා විදේශ ආයෝජන ආදායම් ඇතුළත් කරනුයේ ගෙවුම් ශේෂ ලේඛනයේ කවර ගිණුමක ද?

1. ප්‍රාග්ධන ගිණුම හා ආදායම් ගිණුම.
2. මූල්‍ය ගිණුම හා මූල්‍ය ගිණුම.
3. මූල්‍ය ගිණුම හා ආදායම් ගිණුම.
4. සංක්‍රාම ගිණුම හා වර්තන ගිණුම.
5. සංක්‍රාම ගිණුම හා ආදායම් ගිණුම.

38. ශ්‍රී ලංකාවේ සමාගමක කොටස් විදේශ ආයෝජකයන් මිලට ගැනීම සටහන් කරනුයේ,

1. භාණ්ඩ ගිණුමේ බැර ශේෂයක් ලෙස ය.
2. වර්තන ගිණුමේ හර ශේෂයක් ලෙස ය.
3. මූල්‍ය ගිණුමේ බැර ශේෂයක් ලෙස ය.
4. ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂයක් ලෙස ය.
5. ආදායම් ගිණුමේ හර ශේෂයක් ලෙස ය.

Sabaragamuwa University Of Sri Lanka

39. සඵල ආරක්ෂණ අනුපාතිකය මගින් මැන දක්වන්නේ,

1. ආනයනය කරන ලද භාණ්ඩ මත පනවා ඇති නාමික තීරු බදු අනුපාතිකය යි.
2. ආනයනය කරන ලද අමුද්‍රව්‍ය මත පනවා ඇති නාමික තීරු බදු අනුපාතය යි.
3. තීරු බදු හේතුවෙන් දේශීය වෙළඳපොලේ භාණ්ඩවල මිල ඉහළ ගොස් ඇති අනුපාතය යි.
4. ආනයනය කරන ලද භාණ්ඩ මත බදු පැනවීම හේතුවෙන් දේශීය වශයෙන් වටිනාකමට එකතු කරන ලද ප්‍රමාණය යි.
5. ආනයනය කරන භාණ්ඩ මත බදු පැන්වීමෙන් පසු දේශීය වශයෙන් වටිනාකමට එකතු කරන ලද ප්‍රතිශතය වෙනස් වී ඇති අනුපාතය යි.

40. පහත දැක්වෙන්නේ සමාන සම්පත් ඒකකයක් භාවිතා කොට තේ සහ රබර් නිෂ්පාදනය කිරීමේදී ලංකාවට සහ ඉන්දියාවට ලබාගත හැකි උපරිම නිමවුම් ප්‍රමාණයයි.

	ලංකාව	ඉන්දියාව
තේ	10	8
රබර්	20	10

නිවැරදි පිළිතුර වනුයේ,

1. තේ නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසි ඉන්දියාව සතු වේ.
2. තේ නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි ඉන්දියාව සතු වේ.
3. රබර් නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසි ඉන්දියාව සතු වේ.
4. තේ නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි ලංකාව සතු වේ.
5. රබර් නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි ඉන්දියාව සතු වේ.

University Of Sri Lanka

41. සම්පත් ඒකක ප්‍රමාණයකින් මැලේසියාවට හා සිංගප්පූරුවට නිපදවිය හැකි විකල්ප නිමැවුම් පහත දැක්වෙන නිශ්පාදන හැකියා මායිම් වක්‍ර වලින් පෙන්නුම් කෙරේ.



වෙළඳාමෙන් දෙරටට ම අන්‍යොන්‍ය වශයෙන් වාසි ලැබීම සඳහා කැමරා හා ශීතකරණ අතර හුවමාරු අනුපාතය තීරණය විය යුත්තේ,

1. ශීතකරණයක් සඳහා කැමරා 6 කට අඩු ප්‍රමාණයක් ලෙස ය.
2. ශීතකරණයක් සඳහා කැමරා 3 කට අඩු ප්‍රමාණයක් ලෙස ය.
3. ශීතකරණයක් සඳහා කැමරා 3 ත් 6 ත් අතර ප්‍රමාණයක් ලෙස ය.
4. ශීතකරණයක් සඳහා කැමරා 2 ත් 8 ත් අතර ප්‍රමාණයක් ලෙස ය.
5. ශීතකරණයක් සඳහා කැමරා 12ත් 24ත් අතර ප්‍රමාණයක් ලෙස ය.

42. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2015 දී පිහිට වූ අන්තර් සම්බන්ධිත තිරසාර සංවර්ධන ඉලක්ක ගණන සහ එම ගෝලීය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන වසර පිළිවෙලින් දැක්වෙනුයේ,

1. ඉලක්ක 15ක් සහ 2025 වසරේදීය.
2. ඉලක්ක 17ක් සහ 2030 වසරේදීය.
3. ඉලක්ක 15ක් සහ 2030 වසරේදීය.
4. ඉලක්ක 17ක් සහ 2025 වසරේදීය.
5. ඉලක්ක 17ක් සහ 2035 වසරේදීය.

43. කිසියම් කල්පිත රටක 2021 වසරට අදාලව ජනගහන, සේවා නියුක්ති සහ සේවා වියුක්ති දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

වර්ෂය	ජනගහනය	වැඩකළ හැකි වයසේ ජනගහනය	සේවා නියුක්ති සංඛ්‍යාව	සේවා වියුක්ති සංඛ්‍යාව
2021	70	40	15	5

එම රටෙහි 2021 වසරට අදාල ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය , සේවා වියුක්ති අනුපාතය සහ සේවා නියුක්ති අනුපාතිකය පිළිවෙළින් දැක්වෙනුයේ,

1. 45%, 30%, 70%
2. 50%, 25%, 75%
3. 40%, 25%, 75%
4. 60%, 30%, 70%
5. 50%, 30%, 70%

44. නිරපේක්ෂ දරිද්‍රතාවය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. ආදායම් ව්‍යාප්තියේ විෂමතාව හේතුවෙන් ඇතැම් ජන කොටස් වලට අනෙකුත් ජන කොටස්වලට වඩා අඩු ආදායමක් ලැබෙන තත්ත්වය නිරපේක්ෂ දරිද්‍රතාවය ලෙස හඳුන්වයි.
2. කිසියම් පුද්ගලයකුට හෝ කුටුම්භයකට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන තත්ත්වයක් නිරපේක්ෂ දරිද්‍රතාවය ලෙස හඳුන්වයි.
3. ජාතික දරිද්‍රතා ඉම හා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම මගින් නිරපේක්ෂ දරිද්‍රතාවය පෙන්වයි.
4. නිරපේක්ෂ දරිද්‍රතාවය යනු දරිද්‍රතාවයේ ස්වරූපයකි.
5. ජීවත්වීම සඳහා අවම මූලික අවශ්‍යතාවයන් සපයා ගැනීමට නොහැකි තත්ත්වය හෙවත් නිදන්ගත දුගී බව නිරපේක්ෂ දරිද්‍රතාවය ලෙස හඳුන්වයි.

45. 1978 – 1994 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මේ අතරින් මොනවාද?

a) ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇතිවීම.
b) අපනයන අභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වය
c) ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ කිරීම.
d) දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.

1. a සහ b පමණි. 3. a, b සහ d පමණි. 5. c පමණි.
2. a, b සහ c පමණි. 4. a, b, c සහ d යන සියල්ලම.

46. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ස්වයංක්‍රීය ස්ථායිකාරකයක් සඳහා හොඳම උදාහරණය වන්නේ,

1. මහාමාර්ග වලට කරනු ලබන රාජ්‍ය වියදම් වැඩි කිරීම.
2. විශ්‍රාමික හමුදා නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.
3. මුදල් සැපයුම අඩු කිරීම.
4. විරැකියා රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම.
5. සංක්‍රාම දීමනා ලබාදීම.

Sabaragamuwa University Of Sri Lanka

47. තාක්ෂණික විපර්යාස සහ ඇතැම් කර්මාන්ත ආර්ථිකය තුළ යල්පැන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන විරැකියාව හඳුන්වන්නේ,

1. සෘතුමය විරැකියාව
2. ව්‍යුහාත්මක විරැකියාව
3. තාක්ෂණික විරැකියාව
4. සාර්ෂික විරැකියාව
5. සෘතුමය හා තාක්ෂණික විරැකියාව

48. ව්‍යාපාර කිරීමේ පහසුව පෙන්නුම් කරන දර්ශකය සඳහා ඇතුළත් වන ක්ශේත්‍රයක් නොවන්නේ,

1. රටින් පිටතට භාණ්ඩ අලෙවි කිරීමේ දැඩි බව හෝ ලිහිල් බව.
2. විදුලිය ලබා ගැනීමට ඇති දැඩි බව හෝ ලිහිල් බව.
3. ආයෝජකයින් ආරක්ෂා කිරීම කෙරෙහි පවතින දැඩි බව හෝ ලිහිල් බව.
4. නවෝත්පාදන නැඹුරුව කෙරෙහි පවතින දැඩි බව හෝ ලිහිල් බව.
5. ණය පහසුකම් ලබාගැනීමේදී පවතින දැඩි බව හෝ ලිහිල් බව.

49. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2020 අනුව උද්ධමනය, විරැකියාව හා ආර්ථික වර්ධන අනුපාතිකය පිළිවෙලින් දැක්වෙනුයේ,

1. 6.4%, 4.6%, -3.42%
2. 3.53%, 4.9%, -3.8%
3. 6.15%, 4.84%, -3.62%
4. 7.01%, 5.1%, -4.2%
5. 6.4%, 4.2%, -3.62%

50. පහත සඳහන් දෑ අතුරින් ගිනි සංගුණකය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ගිනි සංගුණකය 0.2 ට වැඩි නම් පරිපූර්ණ ආදායම් සමානාත්මතාවය ද, 0.5 ට වැඩි නම් බරපතළ ආදායම් පරතරය ද නියෝජනය කරයි.
2. ගිනි සංගුණකය 0.4 ට වැඩි නම් පරිපූර්ණ ආදායම් සමානාත්මතාවය ද, 0.6 ට වැඩි නම් බරපතළ ආදායම් සමානාත්මතාවය ද නිරූපණය කරයි.
3. ගිනි සංගුණකය 0.4 – 0.5 ප්‍රමාණවත් සමානතාවය නිරූපණය කරයි.
4. ගිනි සංගුණකය 0.3 – 0.4 විශාල ආදායම් පරතරය නියෝජනය කරයි.
5. ගිනි සංගුණකය 0.5 ට වැඩි අගය පරිපූර්ණ ආදායම් සමානාත්මතාවය නියෝජනය කරයි.

Sabaragamuwa University Of Sri Lanka